ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No.

ඔබේ අංකය / உமது இல. / Your No.

දිනය / திகதி / Date. 2025.06.23

ඒ.බී.එස්.නිරෝෂන් මහතා,
"සන්විඳු", කැබිලියපල දකුණ,
හක්මන.

<u>පැමිණිලිකාර පාර්ශවය</u>

පො.ප. උඩුගම්පොල මහතා,
පොලිස් ස්ථානය, තංගල්ල.

<u>වගඋත්තරකාර පාර්ශවය</u>

***<u>පැමිණිලි අංකය : HRC/1214/19</u>***

<u>**පැමිණිලිකාර පාර්ශවයේ කරුණු දැක්වීම**</u> :

පැමිණිලිකාර පාර්ශවය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිල්ලක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටින්නේ, 2019.04.12 දින පෙරවරු 5.00 ට පමණ බෙලිඅත්ත, ගොඩකුඹුර හන්දියේදී පැමිණිලිකරු, පැමිණිලිකාරුගේ ඥාති සහෝදරයන් දෙදෙනෙකු සමඟ මෝටර් රථයෙන් ගමන් කරමින් සිටියදි වගඋත්තරකාර පොලිස් නිලධාරියා විසින් වාහනය නතර කර බැණ තර්ජනය කළ බවත්, පැමිණිලිකරු සතුව රියදුරු බලපත්‍රය, හැඳුනුම්පත සහ ආදායම් බලපත්‍රය තිබු බවත්, කිසිදු නීති විරෝධී හෝ සැක කටයුතු ද්‍රව්‍යයක් නොතිබු බවත්, එහෙත් වගඋත්තරකාර නිලධාරියා විසින් ඉතා අප්‍රසන්න ලෙස අසභ්‍ය වචනයෙන් බැණ වැදී තර්ජනය කර බෙල්ලෙන් අල්ලා ජීප් රථයට ගෙන ගොස් අත්විලංගු දමා පොලිස් ස්ථානයට ගෙන ගිය බවත්, එහිදී කටඋත්තරයක් ලබාගත් බවත්, පැමිණිලිකරුගේ ජංගම දුරකථනය, මුදල් සහ ඔරලෝසුව වගඋත්තරකාර නිලධාරියා භාරයට ගෙන පැමිණිලිකරු ඇතුළු අනෙක් පුද්ගලයන් දෙදෙනාව පොලිස් සිර මැදිරියට දැමු බවයි.

ඉන්පසුව බෙලිඅත්ත පොලිසියේ ස්ථානාධිපති විසින් පැමිණිලිකරු ඇතුළු අනෙක් පුද්ගලයන් දෙදෙනාට ඇප ලබාදීමට කටයුතු කළ බවත්, ඇප ලබා ගැනීමෙන් අනතුරුව පැමිණිලිකරු විසින් මේ සම්බන්ධයෙන් තංගල්ල පොලිස් අධිකාරිවරයා වෙත පැමිණිලි කළ බවත්, පසුව වගඋත්තරකාර නිලධාරියාව දකුණු පළාතෙන් පිට ස්ථානයකට ස්ථාන මාරු කරනු ලැබු බවයි.

**පැමිණිල්ල සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සාක්ෂි** :

- **හක්මන, කැබලියපල දකුණ, උඩහකොරටුව හි පදිංචි කස්තුරි ආරච්චිගේ අරුණ ප්‍රියන්ත යන අයගේ දිවුරුම් ප්‍රකාශය**

පැමිණිලිකරු සමඟ කාර් රථයේ ගමන් කළ හක්මන, කැබලියපල දකුණ, උඩහකොරටුව හි පදිංචි කස්තුරි ආරච්චිගේ අරුණ ප්‍රියන්ත යන අය පැමිණිල්ල තහවුරු කිරීම සඳහා සාක්ෂි වශයෙන් දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කරමින් ප්‍රකාශ කර සිටින්නේ, 2019.04.12 දින පාන්දර 4.30 ට පමණ තම නැන්දාගේ පුතා වන නිරෝෂන් මංගල යන අය ජංගම දුරකථනයෙන් ඇමතුමක් ලබාදෙමින් තිස්සමහාරාමයට ගිහින් ඒමට අවශ්‍ය බවට ප්‍රකාශ කළ බවත්, ඒ අනුව නිරෝෂන් මංගල යන අයගේ කාර් රථයෙන් ඔහුගේ මස්සිනා වන උපුල් ද සමඟ තිස්සමහාරාමය බලා ගමන් කරමින් සිටියදී, බෙලිඅත්ත නගරයෙන් දික්වැල්ල දෙසට ගමන්



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: අංක. 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு - 04. / No. 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தவிசாளர் / Chairman: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන: 94-11-2505580 / 81 / 82
ලේකම්: 011 2505521
ක්ෂණික: 1996
වෙබ්

කරන අවස්ථාවේදී ගොඩකුඹුර හන්දියේදී පොලිස් නිලධාරීන් විසින් වාහනය නවත්වන ලෙසට සංඥා කළ බවත්, වාහනයක නතර කිරීමෙන් පසුව වගඋත්තරකාර උ.පො.ප. උඩුගම්පල මහතා වෙත නිරෝෂන් යන අය විසින් රියදුරු බලපත්‍රය ලබාදුන් බවත්, ඒ අවස්ථාවේදී වගඋත්තරකාර නිලධාරියා විසින් "උඹලා කොහේ ඉඳලාද එන්නේ, උඹලා කොහෙටද යන්නේ" යනුවෙන් උස් හඬින් පරුෂ වචනයෙන් බැණ වැදීමට පටන් ගත් බවත්, එවිට තමන් ඇතුළු පිරිස ඔවුන් කළ වරද විමසා සිටි බවත්, ඉන්පසුව එම නිලධාරියා අනෙක් නිලධාරීන්ට සම්පූර්ණයෙන්ම වාහනය පරීක්ෂා කරන ලෙසට දැනුම්දුන් බවත්, ඒ අවස්ථාවේදී වාහනයේ නෙස්ටමෝල්ට් පැකට් තුනක් සහ මැගී නූඩ්ල්ස් පැකට් එකක් තිබෙනු දැක වගඋත්තරකාර නිලධාරියා විසින් "උඹලට නෙස්ටමෝල්ට් පැකට් තුනක් කොහෙන්ද" කියා විමසූ බවත්, එවිට උපුල් යන අය විසින් තමා කඩයක් කරන බවත්, ඒවා ගෙදරට රැගෙන යන බවට ප්‍රකාශ කළ බවත්ය. පසුව තමන් ඇතුළු තිදෙනාව වාහනයෙන් බස්සවන ලද බවත්, එවිට නිරෝෂන් යන අය විසින් වාහනයේ නෙස්ටමෝල්ට් ගෙන යාමට තහනම් කර තිබෙනවාදැයි විමසූ බවත්, එවිට වගඋත්තරකාර නිලධාරියා විසින් උස් හඬින් පරුෂ වචනයෙන් බැණ වදිමින් "නෙස්ටමෝල්ට් උණු කරලා හා කූල් කරලා පෙන්වන්නම්" යැයි කියමින් නිරෝෂන් යන අය ඉදිරියට කඩා පැන ඔහු ඇඳ සිටි කමිසයෙන් අල්ලා හොල්ලා ඔහුගේ බඩට ඇන්න බවත්, තර්ජනය කළ බවත්, ඉන්පසුව නිරෝෂන් යන අයගේ අත් දෙකට මාංචු දැමූ බවත්, පසුව පොලිස් ස්ථානයට රැගෙන ගිය බවත්ය.

- **දික්වැල්ල, කෙමගොඩ, උපුල් ස්ටෝර්ස් හි පදිංචි උපුල් ශාන්ත විජේසිංහ යන අයගේ දිවුරුම් ප්‍රකාශය**

ඉහත නම් සඳහන් උපුල් ශාන්ත විජේසිංහ යන අය දිවුරුම් ප්‍රකාශයක් ලබාදෙමින් ඉහත කරුණු සනාථ ක ඇති අතර, ඔහුගේ ප්‍රකාශයේද දක්වා ඇත්තේ නෙස්ටමෝල්ට් ගෙන යාමට තහනම් දැයි විමසූ විට උඩුගම්පල නිලධාරියා විසින් නිරෝෂන් යන අයගේ බෙල්ලෙන් අල්ලා සොලවා ඔහුගේ බඩට ඇණ මාංචු දමා පොලිස් ස්ථානය වෙත රැගෙන ගිය බවයි.

<u>වගඋත්තරකාර පාර්ශවයේ කරුණු දැක්වීම</u>

- **වගඋත්තරකාර පො.ප. උඩුගම්පොල යන අයගේ කරුණු දැක්වීම :**

ඉහත පැමිණිල්ල සම්බන්ධයෙන් වගඋත්තරකරු කරුණු දක්වමින් ප්‍රකාශ කර සිටින්නේ, තමා වෙත එල්ල වී ඇති චෝදනා සියල්ල ප්‍රතික්ෂේප කරන බවත්, තංගල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිගේ නියෝග මත අපරාධ මෙහෙයුම් සඳහා තංගල්ල පොලිසියේ රාජකාරි කළ තමා ඇතුළු නිලධාරීන් කණ්ඩායමක් නම් කර තිබූ බවත්, ඒ අනුව එම කණ්ඩායම සමඟ බෙලිඅත්ත පොලිස් ස්ථානයට ගොස් එම ස්ථානාධිපතිවරයාගේ උපදෙස් පරිදි පැමිණිලිකරු සඳහන් කර ඇති ස්ථානයේ මාර්ග බාධකයේ රාජකාරි කටයුතු කළ බවත්, එහිදී තමාට ලැබී තිබූ උපදෙස් අනුව තංගල්ල කොට්ඨාශයේ සිටින අපරාධකරුවන් අත්අඩංගුවට ගැනීම, සැක කටයුතු වාහන පරීක්ෂා කිරීම, සැක කටයුතු පුද්ගලයන් අත්අඩංගුවට ගෙන ආසන්න පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ බවත්ය.

තමාගේ මතකයේ හැටියට පැමිණිල්ලේ සඳහන් සිද්ධිය වූ දින පැය 4.00 – 4.30ත් අතර බෙලිඅත්ත දෙස සිට පැමිණි මරුටි වාහනයක් නතර කරන ලද බවත්, එහි පුද්ගලයන් තිදෙනෙක් සිටි බවත්, ඔවුන්ගෙන් දිගින් දිගටම ප්‍රශ්ණ කිරීමේදී එක් පුද්ගලයෙක් ඉදිරිපත් කළ තොරතුරු එකිනෙකට පරස්පර වීම නිසා මෙම පුද්ගලයන් යම් අපරාධයකට සම්බන්ධ ද යන්න පිළිබඳව තමාට සැකයක් මතු වූ බවත්, ඒ අනුව එය නිරාකරණය කර ගැනීම පිණිස අත්අඩංගුවට ගෙන බෙලිඅත්ත පොලිස් ස්ථානයට ඉදිරිපත් කරන ලද බවත්, ඔවුන් තවදුරටත් අපරාධයක් සම්බන්ධයෙන් අවශ්‍ය කරන පුද්ගලයෙක් දැයි පරීක්ෂා කිරීම පිණිස ඇඟිලි සලකුනු සහ නැවත ඔවුන්ගෙන් ප්‍රකාශ ලබාගත් බවත්ය. පසුව බෙලිඅත්ත පොලිස් ස්ථානාධිපති විසින් ලේඛන පරීක්ෂා කර බලා ඔවුන්ව පොලිස් ඇප මත නිදහස් කර ඇති බව වැඩිදුරටත් සඳහන් කර ඇත.

තවද, මෙම පැමිණිලිකරු ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීවරයෙක් ලෙස කටයුතු කරන බවත්, මෙය ඔහු සිය දේශපාලන බලය පොලිස් නිලධාරීන්ට මවාපෑම සඳහා සිදුකරන ලද පැමිණිල්ලක් වන බවත්, පැමිණිලිකරු අත්අඩංගුවට ගත් අවස්ථාවේදීම හක්මන එවකට සිටි ස්ථානාධිපති පො.ප. නලින් මහතා ඔහුගේ නිල දුරකථනයෙන් තමා වෙත ඇමතුමක් ලබාදී මෙම පුද්ගලයන් නිදහස් කිරීමට බලපෑම් සිදුකරන ලද බවත්, ඒ බව තමා විසින් තමාගේ සටහන් පොතෙහි ද ඇතුළත් කළ බවයි.

කොමිෂන් සභාව විසින් වගඋත්තරකාර නිලධාරියාගෙන් තවදුරටත් අදාළ සිද්ධිය සම්බන්ධයෙන් කරුණු විමසීම කිරීමේදී ඔහු විසින් ප්‍රකාශ කර ඇත්තේ, සිද්ධිය වූ දින පාන්දර 3.00 සිට 5.00 දක්වා රාජකාරි සිදුකරන

ලද බවත්, එහිදී වාහන තුනක් පරික්ෂා කරන ලද බවත්, සැකකරුවන් තිදෙනෙක් අත්අඩංගුවට ගෙන ඇති බවත්ය.

මෙම පැමිණිලිකරුවන් අත්අඩංගුවට ගැනීමට හේතුව විමසීමේදී එම සැකකරුවන්ගෙන් වෙන වෙනම ප්‍රශ්ණ කළ බවත්, එහිදී ලබාදුන් පිළිතුරු අනුව ඔවුන් යන ගමන් දිශාව කුමක්ද, කුමන හේතුවක් මත එහි යන්නේද, පදිංචිව සිටින ස්ථාන සහ රාත්‍රිය ගත කළ ස්ථාන පිළිබඳව ඉදිරිපත් කළ කරුණු එකිනෙකට පරස්පර බැවින් මොවුන් යම් අපරාධයකට සම්බන්ධද යන්න තවදුරටත් පරික්ෂා කිරීම සඳහා බෙලිත්ත පොලිස් ස්ථානයට රැගෙන ගොස් ලේඛන වල මේ සම්බන්ධයෙන් වාර්තා කර බෙලිඅත්ත පොලිසියට භාරදුන් බවත්, දේශපාලන අධිකාරිය විසින් සිදුකළ බලපෑම මත මොවුන්ට ඇප ලබාදී ඇති බව තමන් විසින් පසුව දැනගත් බවයි. පැමිණිලිකරු සතුව කිසිදු නීති විරෝධී භාණ්ඩයක් නොතිබූ බව ද වගඋත්තරකරු විසින් වැඩිදුරටත් ප්‍රකාශ කර ඇත.

<u>නිරීක්ෂණ</u> :

පැමිණිලිකරු සතු වාහනයෙන් ගමන් කරමින් සිටියදී වගඋත්තරකරු ඇතුළු පොලිස් නිලධාරීන් විසින් පැමිණිල්ලේ සඳහන් කරන ස්ථානයේදී පැමිණිලිකරුව නතර කර ඇති බවත්, ඒ අවස්ථාවේදී පැමිණිලිකරු සතුව රියදුරු බලපත්‍රය, ගමන් බලපත්‍රය සහ හැඳුනුම්පත තිබී ඇති බවත් නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු ගමන් කළ රථයේ කිසිදු නීති විරෝධි ද්‍රව්‍යයක් හෝ සැක කටයුතු ද්‍රව්‍යයක් තිබී නොමැති බව නිරීක්ෂණය වේ.

පැමිණිල්ල සනාථ කිරීම සඳහා ලබාදී ඇති දිවුරුම් ප්‍රකාශ අනුව වගඋත්තරකාර නිලධාරියා විසින් කාර් රථයේ තිබූ නෙස්ටමෝල්ට් පැකට් සම්බන්ධයෙන් විමසීමේදී එම ද්‍රව්‍ය රැගෙන යාමට තහනම් ද යන්න පැමිණිලිකරු විසින් විමසීමෙන් පසුව වගඋත්තරකරුගේ ප්‍රතිචාරය වෙනස් වී ඇති බව දක්වා ඇත.

වගඋත්තරකරුගේ කරුණු දැක්වීමේදී වගඋත්තරකරු ප්‍රකාශ කර සිටින්නේ, පැමිණිලිකරු සහ පැමිණිලිකරුගේ රථයේ ගමන් කළ පුද්ගලයන් දෙදෙනාගෙන් අසන ලද ප්‍රශ්ණ අනුව පැහැදිලි පිළිතුරු නොදීමත් පරස්පර පිළිතුරු ලබාදීමත් නිසා ඔවුන් අපරාධයකට සම්බන්ධ පුද්ගලයන් බවට තමා තුළ සැකයක් පැවතුනු බැවින්, ඒ සම්බන්ධයෙන් වැඩිදුර පරික්ෂා කිරීම සඳහා අත්අඩංගුවට ගෙන පොලිස් ස්ථානයට රැගෙන ගිය බවයි. පොලිස් ස්ථානයට රැගෙන යාමට පෙර හක්මන පොලිස් ස්ථානයේ ස්ථානාධිපතිවරයා තමා වෙත දුරකථනයෙන් කථා කර මෙම පුද්ගලයන් නිදහස් කරන ලෙසට තමා වෙත දැනුම්දුන් බවට වගඋත්තරකරු පිළිගනී. ඒ අනුව මෙම පුද්ගලයන්ගේ අනන්‍යතාවය ඒ මගින් තහවුරු වන බැවින් ද, මොවුන් සතුව කිසිදු නීති විරෝධි හෝ සැක කටයුතු භාණ්ඩ නොතිබූ බැවින් ද පැමිණිලිකරුව අත්අඩංගුවට ගෙන වැඩිදුර පරීක්ෂණයක් සිදුකළ යුතු බවට වගඋත්තරකරුගේ ස්ථාවරය පිළිගත නොහැක.

පැමිණිල්ල සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී - තංගල්ල වෙතින් කොමිෂන් සභාව විසින් වාර්තාවක් කැඳවා ඇති අතර,එම වාර්තාවේ දක්වා ඇත්තේ මෙම සිද්ධිය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වා නිර්දේශයක් ලබාදී ඇති අතර, එම නිර්දේශයේ මෙම වගඋත්තරකාර නිලධාරියා පොලිස් නිලධාරියෙකු වශයෙන් මහජනයා සමඟ කටයුතු කිරීමේදී මීට වඩා ආචාරශීලීව සහ සුහදශීලීව කටයුතු කරන ලෙසට දැනුම් දෙමින් අවවාද පත්‍රයක් නිකුත් කර ඇත.

තංගල්ල ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරිවරයාගේ ඉහත වර්තාව අනුව, වගඋත්තරකරු සමඟ එම ස්ථානයේ රාජකාරි කරන ලද නිලධාන්ගේ ප්‍රකාශ සලකා බැලීමේදී එහිදී වගඋත්තරකරු විසින් පැමිණිලිකරුවන්ට උස් හඬින් ආමන්ත්‍රණය කර ඇති බවට නිරීක්ෂණය වන අතර, පැමිණිලිකරුවන් ඇතුළු පුද්ගලයන් තිදෙනා අත්අඩංගුවට ගැනීමට සාධාරණ සැකයක් තිබූ බවට අනාවරණය නොවේ.

<u>නිගමනය</u> :

1978 ශ්‍රී ලංකා ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාව යටතේ තහවුරු කර ඇති ආකාරයට යම් පුද්ගලයෙකු අත්අඩංගුවට ගත යුත්තේ නීතියෙන් නියම කර ඇති ක්‍රියාපටිපාටියට අනුවය.

ලන්දගේ ඉෂාරා අංජලී සහ විජේසිංහ චූලංගනී එදිරිව වරුණි බෝගහවත්ත සහ වෙනත් අය (SC FR 677/2012) නඩුවේදී 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථාව අනුව අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීමෙන් නිදහස් වන අතර, යම් හෙයකින් නිදහස අහිමි කරන්නේ නම් නීතියෙන් ස්ථාපිත කර ඇති ක්‍රියාපටිපාටිය දැඩි ලෙස අනුගමනය කළ යුතු බවට දක්වා ඇති අතර, අභිමතය පරිදි හෝ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම මෙම ක්‍රියාපටිපාටියේ විධිවිධාන මඟින් වලක්වා ඇත.

තවද 1979 අංක 15 දරණ අපරාධ නඩු විධාන සංග්‍රහයේ 32 වන වගන්තිය අනුව වරෙන්තුවක් නොමැතිව පුද්ගලයෙකු අත්අඩංගුවට ගන්නේ නම්, ඔහුට විරුද්ධව පැමිණිල්ලක් සාධාරණ සැකයක් හෝ එම පුද්ගලයාට විරුද්ධව යම් තොරතුරක් ලැබී තිබිය යුතු අතර, එය විමර්ශනය කොට තහවුරු වීමෙන් පසුව අත්අඩංගුවට ගැනීම සිදුකළ යුතුය.

ඒ අනුව ඉහත දක්වන ලද සියලු කරුණු සමස්තයක් ලෙස ගෙන සලකා බැලීමේදී පැමිණිලිකරුවන් පිළිබඳව අනන්‍යතාවය තහවුරු කර තිබියදීත්, පැමිණිලිකරුවන් අත්අඩංගුවට ගැනීම තුළින් වගඋත්තරකරු විසින් 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පරිච්ඡේදයේ 13(1) ව්‍යවස්ථාව මඟින් සුරක්ෂිත කොට ඇති පැමිණිලිකරුගේ මූලික අයිතිවාසිකම උල්ලංඝනය කර ඇති බවට නිගමනය කරනු ලැබේ.

**ඒ අනුව පහත නිර්දේශයන් ඉදිරිපත් කර සිටි.**

01. වගඋත්තරකාර පාර්ශවය විසින් පැමිණිලිකාර පාර්ශවය වෙත රුපියල් විසිපන් දහසක(රු. 25,000/-) මුදලක් වන්දි වශයෙන් ගෙවිය යුතුය.

02. මෙම සිදුවීමේදී වගඋත්තරකාර පාර්ශවය විසින් ක්‍රියාකර ඇති ආකාරය පිළිබඳව පරීක්ෂණයක් පවත්වා සුදුසු පියවර ගැනීමට පොලිස්පතිවරයා විසින් කටයුතු කළ යුතු අතර, එලෙස ගනු ලබන පියවර සම්බන්ධයෙන් කොමිෂන් සභාව දැනුම්වත් කළ යුතුය.

2025.07.31 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධයෙන් වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15(7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම, එකී නිර්දේශය ක්‍රියාත්මක කර ඉදිරිපත් කිරීමට නියමිත දින සිට සතියක කාලයක් තුළ මෙම නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකාර පාර්ශවය විසින් ද කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් සලකා නොබලන බව ද වැඩිදුරටත් දන්වමු.

එල්.ටී.බී.දෙහිදෙණිය,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (හිටපු)
සභාපති,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු එල්.ටී.බී.දෙහිදෙණිය
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

නිමල් ජී.පුංචිහේවා,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නිමල් ජී. පුංචිහේවා
ජ්‍යෙෂ්ඨ නීතිඥ
කොමසාරිස්
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :01. අමාත්‍යතුමා, - කරුණු දැනගැනීම සඳහා
මහජන ආරක්ෂක අමාත්‍යංශය,
04 වන මහල, සුහුරුපාය, බත්තරමුල්ල.

02. පොලිස්පති, - අදාළ නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා
ශ්‍රී ලංකා පොලිසිය.

සැ.යු. - අදාළ මුදල "මුදල් ඇණවුමක්" මඟින් පැමිණිලිකාර පාර්ශවය වෙත ගෙවා එහි පිටපතක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන්න.
ස/-